# 2014 වර්ෂයේ සිට බස්නාහිර පළාත් රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් ක්‍රියාත්මක සුපසන් ගුරු පවුර රක්ෂණාවරණය/බස්නාහිර පළාත් රාජ්‍ය සේවක රක්ෂණාවරණය පිළිබඳ තොරතුරු වාර්තාව


පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
දෙවන මහල
<u>බස්නාහිර පළාත් සභා කාර්යාල සංකීර්ණය</u>
<u>ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත</u>
<u>බත්තරමුල්ල</u>

**2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන**
**සුපසන් ගුරු පවුර/ බස්නාහිර පළාත් රාජ්‍ය සේවක ජීවිත සමූහ රක්ෂණාවරණය**

| ප්‍රතිලාභ | වන්දි මුදල (රු.) |
|---|---|
| ස්වභාවික මරණ ප්‍රතිලාභය | 500,000 |
| හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය | 1,000,000 |
| දීර්ඝ කාලීන ස්ථිර අකර්මන්‍යතා ප්‍රතිලාභය (හදිසි අනතුරකින්) | 500,000 |
| දීර්ඝ කාලීන ස්ථිර අකර්මන්‍යතා ප්‍රතිලාභය (රෝගාබාධ) | 500,000 |
| අර්ධ ස්ථිර අකර්මන්‍යතා ප්‍රතිලාභය | 500,000 |
| අසාධ්‍ය රෝග ආවරණය (ජීවිත රක්ෂණ ඔප්පුවේ සඳහන් රෝගාබාධ 24 සඳහා) | 500,000 |

**වාර්ෂික වාරික මුදල**

**වාර්ෂික වාරික මුදල රු. 1415/-**
**මින් රු. 965/- සාමාජිකයා විසින්ද,**
**රු. 450/- පළාත් සභාවෙන්ද ගෙවා සම්පූර්ණ කෙරේ.**

**රක්ෂිතයාට හිමිවන ප්‍රතිලාභ**

**මරණ ප්‍රතිලාභය**

රක්ෂණාවරණය පවත්නා කාලය තුළ සිදුවන සාමාන්‍ය මරණයකදී රු. 500,000 ක ප්‍රතිලාභයක් ලබා ගත හැකිය.

**හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය**

එක එල්ලේම හදිසි අනතුරක් නිසාම තදබල ලෙස තුවාල ලබා එබදු තුවාල නිසාම දින 90 ක් ඇතුළත බාහිර හේතූන් කිසිවක් නොමැතිව ජීවිත රක්ෂිතයාගේ මරණය සිදුවුවහොත් ඔහුගේ/ඇයගේ ප්‍රතිලාභියාට රු. 1,000,000 ක මුදලක් හිමි වේ.

**දීර්ඝ කාලීන ස්ථිර අකර්මන්‍යතා ප්‍රතිලාභය (හදිසි අනතුරු හේතුවෙන් සිදුවන ස්ථිර අකර්මන්‍යතාවය)**

ජීවිත රක්ෂිතයාට බාහිර ප්‍රචණ්ඩ ක්‍රියාවක් සහ දෘශ්‍යමාන ආකාරයකින් ඇතිවන හදිසි අනතුරක් නිසා අකර්මන්‍යතාවයකට පත්වී තමාගේ වැඩ කටයුතු, රැකියාව කරගෙන යාමට නොහැකි වී වැටුප්, ලාභ උපයා ගැනීමට නොහැකි වීම නිසා රු. 500,000 ක් හිමි වේ.

**දීර්ඝ කාලීන ස්ථිර අකර්මන්‍යතා ප්‍රතිලාභය (රෝගාබාධ හේතුවෙන් සිදුවන ස්ථිර අකර්මන්‍යතාවය)**

ජීවිත රක්ෂිතයා යම් රෝගාබාධයක් නිසා අකර්මන්‍යතාවයකට පත්වී එහි ප්‍රතිඵලයක් වශයෙන් තමාගේ වැඩ කටයුතු, රැකියාව කරගෙන යාමට නොහැකි වී වැටුප්, ලාභ උපයා ගැනීමට නොහැකි වීම නිසා රු. 500,000 ක් හිමි වේ.

**අර්ධ ස්ථිර අකර්මන්‍යතා රක්ෂණාවරණය (හදිසි අනතුරු වලට අදාළව)**

දෘශ්‍යමාන ආකාරයෙන් සිදුවන බරපතල හදිසි අනතුරු හේතුවෙන් පරම වශයෙන් සිදුවන්නාවූද, වෙනත් හේතූන්ගෙන් ස්වාධීන වන්නාවූ ජීවිත රක්ෂිතයා විසින් විඳිනු ලබන ශාරීරිකහානි සඳහා රු. 500,000 ක ප්‍රතිභයක් හිමිවනු ඇත.

**අසාධ්‍ය රෝග ආවරණය** මෙයට අමතරව ජීවිත රක්ෂණ ඔප්පුවේ සඳහන් රෝගාබාධ 24 ක් සඳහා ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

__රක්ෂිතයා විසින් දත යුතු කරුණු__

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු සියළුම පළාත් රාජ්‍ය නිලධාරීන්, පාසල් වල අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සුභසාධනය වෙනුවෙන් ක්‍රියාත්මක කෙරේ.**

1. අග්‍රහාර හෝ වෙනත් රක්ෂණාවරණයක් ලබා ගෙන තිබුණද, 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන සුපසන් ගුරු පවුර/ බස්නාහිර පළාත් රාජ්‍ය සේවක ජීවිත සමූහ රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමට බාධාවක් නොවන අතර, මෙහිදී දායකයා හට ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා..........

- ✓ ස්වභාවික මරණ වලදී මරණ සහතිකය, උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පතෙහි පිටපත සහ වෛද්‍ය වාර්තා සමග රක්ෂණ ප්‍රතිලාභ ඉල්ලීම රක්ෂිතයා වෙනුවෙන් ප්‍රතිලාභියා විසින් ඉදිරිපත් කළ යුතුය. හදිසි අනතුරකින් සිදු වූ මරණයක් නම්, මරණ සහතිකය, උප්පැන්න සහතිකය, හැඳුනුම් පතෙහි පිටපත, අධිකරණ වෛද්‍ය වාර්තා/පොලිස් වාර්තා සහ අදාළ වෛද්‍ය වාර්තාද ඉදිරිපත් කළ යුතුය.

- ✓ අසාධ්‍ය රෝගයක් වෙනුවෙන් ප්‍රතිලාභ ඉල්ලීමේදී රක්ෂිතයාගේ රෝගය හඳුනා ගැනීමට භාවිතා කළ වෛද්‍ය වාර්තාව, රෝග විනිශ්චය වාර්තාව සහ ඊට අදාළ වෙනත් වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතුය.

උදාහරණයක් වශයෙන් බයිපාස් සැත්කමක් වෙනුවෙන් ප්‍රතිලාභ ඉල්ලන්නේ නම්, Angiogram Report සහ Diagnosis Card වල පිටපත් විශේෂයෙන් ඉදිරිපත් කළ යුතුය. ප්‍රතිලාභ ඉල්ලීම සඳහා ඉල්ලුම් පත්‍රයක් භාවිතා නොවන අතර, ලිපියක් මගින් ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය. ප්‍රතිලාභ ඉල්ලීමේදී කිසිදු ආකාරයක බිල්පත් ඉදිරිපත් නොකළ යුතුය.

2. පාසල්වල අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සියළුම රක්ෂණ ප්‍රතිලාභ ඉල්ලීම් විදුහල්පති මගින්ද, විදුහල්පතිවරුන්ගේ රක්ෂණ ප්‍රතිලාභ ඉල්ලීම් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ මගින්ද, තමන් අයත් වන කලාප අධ්‍යාපන කාර්යාලය වෙත එවිය යුතුය. රක්ෂිතයාගේ සේවා ස්ථානය දෙපාර්තමේන්තුවක් හෝ අධිකාරියක් වන අවස්ථාවලදී එම ආයතන ප්‍රධානියා මගින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

3. කිසිම ප්‍රතිලාභ ඉල්ලීමක් වෙනුවෙන් වෛද්‍ය බිල්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. එසේම එක් අසාධ්‍ය රෝගයක් වෙනුවෙන් පමණක් ප්‍රතිලාභ හිමි වේ. මෙය බස්නාහිර පළාත් රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පමණක් ක්‍රියාත්මක කළද, ජාතික මට්ටමේ රක්ෂණාවරණය වන අග්‍රහාර රක්ෂණාවරණයෙන්ද ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලබා දී ඇත.

4. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙන්, මධ්‍යම රජයේ හෝ වෙනත් පළාත් සභාවක ආයතනයකට මාරුවීම් ලැබුවද, රක්ෂණ වාරිකයේ වලංගු කාල සීමාව තුළ රක්ෂණ හිමිකම් ලැබීමට හැකියාව ඇත. එසේ ස්ථාන මාරු ලැබූ රක්ෂිතයෙකු රක්ෂණ වාරිකයේ වලංගු කාල සීමාව අවසන් වීමෙන් පසුව රක්ෂණයේ මුළු වාර්ෂික වාරික මුදල ඔහු/ඇය විසින් ගෙවීමෙන් රක්ෂණ හිමිකම අඛණ්ඩව පවත්වා ගෙන යා හැකිය.

5. රක්ෂණ සාමාජිකත්වය ලබා සිටින යම් නිලධාරියෙක් වයස අවු. 60 වනවිට විශ්‍රාම ලැබුවද, ඉදිරියට මුළු වාර්ෂික වාරික මුදල ගෙවීමෙන් අවු. 70 දක්වා එම රක්ෂණාවරණය පවත්වා ගෙන යාමට හැකියාව ඇති අතර, ඉහත සඳහන් සියළුම ප්‍රතිලාභද හිමිවනු ඇත.

6. රක්ෂණ සාමාජිකයා විසින් නම් කරනු ලබන ඕනෑම වයසක පසුවන තම සහකරුට හෝ සහකාරියට හෝ දරුවෙකුට හෝ ඥාතිවරයෙකුට හෝ හිතවතෙකුට මරණ ප්‍රතිලාභය ලබා ගැනීමට හැකියාව ඇත. එසේම රක්ෂිතයා වෙනුවෙන් මරණ ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා ඔහු/ඇය විසින් නම් කරනු ලබන ප්‍රතිලාභියා

අවශ්‍ය නම්, පසුව කලාප කාර්යාලයේ/අමාත්‍යංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සම්බන්ධීකරණ නිලධාරී වෙත ලිඛිතව දැනුම් දී වෙනස් කිරීමේ හැකියාවද ඇත.

7. රක්ෂිතයා යම් අසාධ්‍ය රෝගයකට අදාළ ප්‍රතිලාභ මුදලක් ලබා ගෙන දින 90 කට (මාස 03 කට) පසුව රක්ෂිතයා එම රෝගයෙන්ම මිය ගියේ වුවද, ඔහුගේ/ඇයගේ මරණයකදී ගෙවනු ලබන රක්ෂණ ප්‍රතිලාභ මුදල රක්ෂණ සාමාජිකයා විසින් නම් කරනු ලබන ප්‍රතිලාභියෙකුට ලබා ගත හැකි වනු ඇත.

8. මෙම රක්ෂණාවරණය රක්ෂණ ආයෝජනයක් නොවන බැවින්, කල් පිරීමේ කාලයක් නොමැත. එහෙයින් ආයෝජිත මුදල නැවත ගෙවීමක් සිදු නොකෙරේ.

9. මෙම රක්ෂණාවරණයේ එක් වර්ෂයක් ලෙය සැළකෙනුයේ.එක් වර්ෂයක ජනවාරි 01 සිට එම වර්ෂයේ දෙසැම්බර් මස 31 දක්වා වන කාල සීමාව වේ.

10. රක්ෂණාවරණ අයදුම්පත සම්පූර්ණ කිරීමේදී එහි අංක 01 සිට 09 දක්වා සියළුම තොරතුරු සපයා දිය යුතු අතර, රක්ෂිත සාමාජිකයාගේ සහ ඔහු/ඇය වෙනුවෙන් නම් කරනු ලබන ප්‍රතිලාභියාගේ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව සටහන් කළ යුතුය. රක්ෂණ සාමාජිකයා විසින් ප්‍රතිලාභ ඉල්ලීමක් ඉදිරිපත් කළ පසුව ඔහු/ඇය සම්බන්ධ කර ගත හැකි ස්ථාවර හෝ ජංගම දුරකථන අංකය පැහැදිලිව අයදුම්පතෙහි සටහන් කළ යුතුය.

11. ඔබ නම් කරනු ලබන ප්‍රතිලාභියා ජාතික හැඳුනුම්පත නොමැති බාල වයස්කාරයෙකු නම්, එම ප්‍රතිලාභායා වෙනුවෙන් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීමෙන් අනතුරුව එම හැඳනුම් පතෙහි අංකය අදාළ කාර්යාලයේ සම්බන්ධීකරණ නිලධාරී වෙත ලිපියක් මගින් සපයා දිය යුතුය.

12. රක්ෂණ අයදුම්පත සම්පූර්ණ කරනු ලබන අවස්ථාවේ ඔබ විසින් නම් කරනු ලබන ප්‍රතිලාභියා පසුකාලීනව වෙනස් කිරීමේ හැකියාවක් පවතින අතර, ඒ බව කාර්යාලයේ සම්බන්ධීකරණ නිලධාරී වෙත ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

13. රක්ෂණ සාමාජිකත්වය ලබා ගැනීමෙන් අනතුරුව ඔබගේ සේවා ස්ථානයෙන්/පාසලෙන් ස්ථාන මාරුවක් ලබා ගන්නා අවස්ථාවේදී රක්ෂණ කටයුතු විධිමත් කිරීම සඳහා ඔබගේ සේවා ප්‍රධානියා මගින් අදාළ කලාප අධ්‍යක්ෂ වෙත පිළිගත් ක්‍රමයකට ඒ පිළිබඳව වාර්තා කිරීම අත්‍යවශ්‍යය.

14. රක්ෂණ සාමාජිකත්වය ලබා ගැනීම වෙනුවෙන් තම වැටුපෙන් අඩකරණය කිරීම සඳහා වාර්ෂිකව එකඟතාවය ලබා දීම අවශ්‍ය නොවේ. එසේ වුවද, යම් හෙයකින් රක්ෂණ සාමාජිකයාගේ වැටුපෙන් අඩකරණය කළ යුතු වාරික මුදලෙහි වැඩි වීමක් වන්නේ නම් පමණක් අදාළ මුදල අඩකරණය කිරීම සඳහා එකඟතාවය ලබා දිය යුතුය.

15. රක්ෂණ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත මුදල් සපයා දීමත් සහ රක්ෂණ සාමාජිකයින්ගේ ජීව දත්ත ඇතළුව නාමලේඛණ සපයා දීමෙන් අනතුරුව රක්ෂණ සහතිකය අදාළ කලාප කාර්යාලයේ හෝ සේවා ස්ථානයේ ප්‍රධානියා මගින් නිකුත් කිරීමට කටයුතු කෙරේ.

16. **ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නමට ලියන ලද චෙක්පත් මගින්** මුදල් සපයා දිය යුතු අතර, නාමලේඛණය ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර විද්‍යුත් තැපැල් මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත යැවිය යුතුය.

***Name of the Institute Name of the Applicant Date of Birth NIC No. Designation***

*විද්‍යුත් තැපැල් ලිපිනය* ***chandiman@srilankainsurance.com***

17. වෙක්පත වන්දිමා නාරංගල, විධායක නිලධාරිණී, 2 වන මහල, ජීවිත දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, වොක්ෂෝල් වීදිය, කොළඹ -02 යන ලිපිනයට ආවරණ ලිපියක් මගින් සපයා දිය යුතුය.

<u>කලාප සම්බන්ධීකරණ නිලධාරීන් සහ දුරකථන අංක</u>

| ආයතනය | නිලධාරියාගේ නම | දුරකථන අංකය |
|---|---|---|
| කොළඹ කලාප කාර්යාලය | නිරෝෂා මිය | 0712216735 |
| ශ්‍රී ජයවර්ධන පුර කලාප කාර්යාලය | දිස්නි මෙනවිය | 0764877047 |
| හෝමාගම කලාප කාර්යාලය | යුරේනි මිය | 0718039576 |
| පිලියන්දල කලාප කාර්යාලය | දීපිකා මිය | 0789163400/0112614995 |
| කැළණිය කලාප කාර්යාලය | කුමුදු මිය | 0772491408 |
| ගම්පහ කලාප කාර්යාලය | කල්හාරි මිය | 0779991783 |
| මිනුවන්ගොඩ කලාප කාර්යාලය | රෂීඩ් මයා | 0767972035 |
| මීගමුව කලාප කාර්යාලය | රුවන් මයා | 0702569340 |
| හොරණ කලාප කාර්යාලය | නිශාදි මෙනවිය | 0342262662 |
| කළුතර කලාප කාර්යාලය | සඳුනි මිය | 0768717547 |
| මතුගම කලාප කාර්යාලය | ගයනි මෙනවිය | 0717096012 |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ශ්‍රියානි මිය | 0713895019 |
| පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය | සුධර්මා එදිරිසූරිය මිය | 0716400025 |
| | ස්වර්ණා ප්‍රනාන්දු මිය | 0714415641/0771587866 |

<u>සුපසන් ගුරු පවුර රක්ෂණාවරණ ප්‍රතිලාභ ගෙවීම 2014 -2020</u>

| අංකය | ප්‍රතිලාභ ලබන හේතුව | ප්‍රතිලාභ සංඛ්‍යාව | ගෙවන ලද මුදල (රු.) |
|---|---|---|---|
| 1 | ස්වභාවික මරණ | 11 x රු. 500,000 | 5,500,000 |
| 2 | අසාධ්‍ය රෝග<br>පිළිකා රෝගය | 2 x රු. 250,000 | 500,000 |
| 3 | - එම - | 16 x රු. 500,000 | 8,000,000 |
| 4 | බයිපාස්/සටෙන්ට් දැමීම | 3 x රු. 125,000 | 375,000 |
| 5 | - එම - | 4 x රු. 250,000 | 1,000,000 |
| 6 | - එම - | 6 x රු. 500,000 | 3,000,000 |
| 7 | මොළයේ ගැටිති ශල්‍ය කර්මය | 2 x රු. 500,000 | 1,000,000 |
| 8 | අංශභාගය/ස්ට්‍රෝක් | 4 x රු. 500,000 | 2,000,000 |
| 9 | හදිසි අනතුරු | 1 x රු. 150,000 | 150,000 |
| 10 | - එම - | 1 x රු. 125,000 | 125,000 |
| 11 | - එම - | 1 x රු. 500,000 | 500,000 |
| 12 | - එම - | 1 x රු. 375,000 | 375,000 |
| 13 | | 52 | 22,525,000 |

2014 – 2020 කාලය තුළ හේතුව අනුව ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව

| අනු අංකය | ප්‍රතිලාභ ලැබීමට හේතුව | ප්‍රතිලාභ සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පිළිකා | 18 |
| 2 | ස්ටෙන්ට් දැමීම | 05 |
| 3 | බයිපාස් සැත්කම | 08 |
| 4 | ස්ට්‍රෝක් සහ අංශභාග රෝගය | 04 |
| 5 | මොළයේ ගැටිති ශල්‍ය කර්මය (ටියුමර්) | 02 |
| 6 | හදිසි අනතුරු | 04 |
| 7 | ස්වභාවික මරණ | 11 |
| | දැනට ගෙවන ලද මුළු ප්‍රතිලාභ සංඛ්‍යාව | 52 |

2014 -2020 කාලය තුළ කලාප මට්ටමින් ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව

| අනු අංකය | අධ්‍යාපන කලාපය/ආයතනය | ප්‍රතිලාභ සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කොළඹ | 03 |
| 2 | ශ්‍රී ජයවර්ධනපුර | 10 |
| 3 | පිළියන්දල | 05 |
| 4 | කැළණිය | 07 |
| 5 | ගම්පහ | 04 |
| 6 | මිනුවන්ගොඩ | 06 |
| 7 | මීගමුව | 08 |
| 8 | හොරණ | 05 |
| 9 | කළුතර | 01 |
| 10 | මතුගම | 01 |
| 11 | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය (2015 ට පෙර) | 02 |
| | දැනට ගෙවන ලද මුළු ප්‍රතිලාභ සංඛ්‍යාව | 52 |

ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

ප්‍රතිලාභ ලබා ගැනීමේදී ඉල්ලුම් පත්‍රයක් යොමු කළ යුතු නැති අතර, රෝහල් බිල්පත් හෝ ඖෂධ බිල්පත් ප්‍රතිලාභ ඉල්ලීම සමග අමාත්‍යාංශය වෙත යොමු නොකළ යුතුය. එම බිල්පත් අග්‍රහාර රක්ෂණයෙන් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

පහත දැක්වෙන පරිදි ප්‍රතිලාභ සඳහා වෛද්‍ය වාර්තා පමණක් යොමු කළ යුතුය.

ප්‍රතිලාභ වෙනුවෙන් ඉදිරිපත් කළ යුතු වෛද්‍ය සහ අනෙකුත් වාර්තා

1. අසාධ්‍ය රෝග ප්‍රතිලාභ වෙනුවෙන්
   - ✓ රෝගය හඳුනා ගැනීම සඳහා කරන ලද පරීක්ෂණ වාර්තා
   - ✓ රෝහල්ගතවීමකදී රෝහලෙන් නිකුත් කරන රෝග විනිශ්චය සටහන (Diagnosis Card)
   - ✓ අදාළ වෙනත් වෛද්‍ය වාර්තා
   - ✓ සුපසන් ගුරු පවුර රක්ෂණාවරණ අයදුම්පතෙහි ඡායා පිටපතක්
   - ✓ වැටුපෙන් අවකරණය කළ බවට ගණකාධිකාරී (වැටුප්) වෙතින් ලබා ගත් සහතික කිරීමේ ලිපියක්

**** 1-3 දක්වා වාර්තාවල ඡායාපිටපත් සමග රක්ෂණ සාමාජිකයා විසින් ඉල්ලම් ලිපියක් තම ආයතන ප්‍රධානියා මගින් කලාප අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

2. <u>ස්වභාවික මරණ ප්‍රතිලාභ වෙනුවෙන්</u>

- ✓ මරණ සහතිකයේ පිටපතක්
- ✓ උප්පැන්න සහතිකයේ පිටපතක්
- ✓ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
- ✓ අදාළ වෛද්‍ය සහතික ඇත්නම් ඒවාද ඉදිරිපත් කළ යුතුය.
- ✓ සුපසන් ගුරු පවුර රක්ෂණාවරණ අයදුම්පතෙහි ඡායා පිටපතක්
- ✓ වැටුපෙන් අවකරණය කළ බවට ගණකාධිකාරී (වැටුප්) වෙතින් ලබා ගත් සහතික කිරීමේ ලිපියක්

**** 1-4 දක්වා වාර්තාවල ඡායාපිටපත් සමග රක්ෂණ සාමාජිකයා විසින් ඉල්ලම් ලිපියක් තම ආයතන ප්‍රධානියා මගින් කලාප අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

3. <u>හදිසි අනතුරු ප්‍රතිලාභ වෙනුවෙන්</u>

- ✓ හදිසි අනතුරට අදාළ වෛද්‍ය වාර්තා
- ✓ පොලිස් වාර්තාව සහ (ඇත්නම්) අධිකරණ වෛද්‍ය වාර්තාව
- ✓ අනතුරට අදාළ සියළුම වෛද්‍ය වාර්තා
- ✓ සුපසන් ගුරු පවුර රක්ෂණාවරණ අයදුම්පතෙහි ඡායා පිටපතක්
- ✓ වැටුපෙන් අවකරණය කළ බවට ගණකාධිකාරී (වැටුප්) වෙතින් ලබා ගත් සහතික කිරීමේ ලිපියක්

**** 1-3 දක්වා වාර්තාවල ඡායාපිටපත් සමග රක්ෂණ සාමාජිකයා විසින් ඉල්ලම් ලිපියක් තම ආයතන ප්‍රධානියා මගින් කලාප අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

4. <u>හදිසි අනතුරු මරණ ප්‍රතිලාභ වෙනුවෙන්</u>

හදිසි අනතුරු ප්‍රතිලාභ වෙනුවෙන් ලබා දෙන වෛද්‍ය වාර්තා සහ ස්වභාවික මරණ ප්‍රතිලාභ වෙනුවෙන් ලබා දෙන සියළුම වාර්තා මේ වෙනුවෙන් ඉදිරිපත් කළ යුතුය.

**සුපසන් ගුරු පවුර රක්ෂණාවරණයෙන් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා රක්ෂණ සාමාජිකයින් අඛණ්ඩව රක්ෂණාවරණ හිමිකම් ලබා සිටීම අත්‍යවශ්‍ය වේ.**

**යම් රක්ෂණ සාමාජිකයෙකුගේ අසාධ්‍ය රෝගයක් හඳුනා ගෙන සතියක් (දින 07) ඇතුළත,**

**බයිපාස් හෝ වෙනත් සැත්කමකට භාජනය වී දින 10 ක් ඇතුළත,**

**හදිසි අනතුරක් සහ මරණයක් සිදූ වී මාසයක් ඇතුළතද, ප්‍රතිලාභ ඉල්ලීම පළාත් අධ්‍යාපන අමාත්‍යංශය වෙත ඉදිරිපත් කළ යුතුය.**

**මේ සම්බන්ධයෙන් සියළුම විමසීම් සඳහා 0714415641/0771587866 සහ 0716400025**